**යාපනය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 15 - 2022**

---

## 1. විගණන මතය

1.1 යාපනය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා පහළොවෙහි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2022 වර්ෂයට අදාළව යාපනය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 15 ට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 15 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 06 ක සමාලෝචිත වර්ෂයේ රු. 28,406,985 ක ප්‍රාග්ධන වියදම් වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබීමෙන් වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන වියදම් ඉදිරියේදි ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක් සමාලෝචිත වර්ෂයේ භෞතිකව නොපැවති රු. 1,644,346 ක් වටිනා ජංගම නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | කපා හැරීමට අවශ්‍ය කටයුතු කර ඇත. | ජංගම නොවන වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 05 ක් භෞතිකව නොපැවති රු. 1,767,399 ක් වටිනා ජංගම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි මුදල් වර්ෂවල අදාල ගැලපුම් සිදු කිරීමට කටයුතු කර ඇත. | ජංගම වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

### 1.3.2 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල<br>රු. | නොසැපසූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් ප්‍රයෝජනයට ගනු ලබන ට්‍රැක්ටර් රථ සඳහා දෛනික ධාවන සටහන්, ලොග් සටහන් පොත්, ඉන්ධන පාරිභෝජන ලේඛනය, වාහන අළුත්වැඩියා ලේඛනය නිසි පරිදි පවත්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ දරන ලද වියදම් සම්බන්ධයෙන් විගණනයේදි පිළිගැනීමට හෝ සනාථ කිරීමට නොහැකි විය. | 6,487,834 | දෛනික ධාවන සටහන්, වාහන ලොග් සටහන් පොත්, ඉන්ධන පරිභෝජන ලේඛනය, වාහන අළුත්වැඩියා ලේඛනය | මෙම කාරක සභා 12 ක් විසින්ම පෙන්වා දෙන ලද ලේඛන අදාල පරිදි නඩත්තු කිරීම මගින් ඉන්ධන වියදම්, රියදුරු බටා සහ අළුත්වැඩියා වියදම් නිසි පරිදි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 12 ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කුඹුරු ඉඩම්වල ප්‍රමාණය හෙක්ටයර් 9866 ක් ලෙස දක්වා තිබුණද, එය සනාථ කිරීම සඳහා කුඹුරු ඉඩම් නාම ලේඛනය විගණනයට ඉදිරිපත් නොකිරීමෙන් වර්ෂයේ අක්කර බදු සහ හිඟ අක්කර බදු පිළිබඳ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | 962,913 | කුඹුරු ඉඩම් නාම ලේඛනය | ඉදිරියේදි මෙම කුඹුරු ඉඩම් නාම ලේඛනය යාවත්කාලීන කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කුඹුරු ඉඩම් නාම ලේඛනය නිසි පරිදි පවත්වා ගෙන යායුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 12 ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබු ණය ගැති ශේෂ 67 ක් සම්බන්ධව ලිඛිත සනාථ | 10,654,295 | විස්තරාත්මක උපලේඛන | ණය ගැති ශේෂ සම්බන්ධයෙන් ලිඛිත සනාථ කිරීම් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | | | |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 15 ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ ණය ගිම් ශේෂ 106 ක් සම්බන්ධව ලිඛිත සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 89,414,474 | විස්තරාත්මක උපලේඛන | ඉදිරියේදි ණය හිමි ශේෂ සඳහා ලිඛිත සනාථ කිරීම් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය හිමි සඳහා ලිඛිත සනාථ කිරීම් ලබා ගත යුතුය. |
| (ඉ) | වණ්ඩිලිප්පායි ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි දක්වා තිබූ බීජ වී ආදායම සනාථ කිරීමට නොහැකිව ඇත. | 208,200 | බීජ වී විකුණුම් ගිණුම | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ බීජ වී ආදායම් වශයෙන් දක්වා තිබූ රු. 208,200 කට අදාල විකුණුම් වැරදීමකින් ගිණුම් වලින් අත්හැරී තිබුණි. | විකුණුම් ගිණුම් පිළියෙල කර බීජ වී ආදායම විධිමත් පරිදි ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 06 ක සමාලෝචිත වර්ෂයේ ගෙවීම් වවුචර් 170 ක් සඳහා ගෙවීම සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 1,906,614 | ප්‍රතිග්‍රාහකයාගේ අත්සන, කුවිතාන්සියේ මුල් පිටපත, ලැබීම් වාර්තාව, මිල ගණන්, ඉල්ලුම්පත්‍ර | ඉදිරියේදි මෙම වරද නිවැරදි කර ගෙවීම් වවුචරය සමග ගෙවීම සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි අදාල පරිදි පවත්වා විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. | ගෙවීම් කිරීමේදි ගෙවීමට අදාල සාක්ෂි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| උඩුවිල් ගොවිජන සේවා කාරක සභාවේ ණයහිමි උපලේඛන අනුව ගෙවිය යුතු ශේෂය | 4,804,363 | 4,178,061 | 626,302 | ඉදිරියේදි මෙවැනි වැරදි සිදු නොවීමටත් ගෙවියයුතු ශේෂයන්හි නිවැරදි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වනු ලැබේ. | ණය නිවැරදිව වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතුය. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවන අවස්ථාවන් පහත දැක්වේ.

| | නීති රිති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | වටිනාකම<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | | |
| | (i) 53 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 15 ක කුඹුරු ඉඩම් නාමලේඛන පිළියෙල කර නොතිබුණි. | - | කුඹුරු ඉඩම් නාමලේඛන පිළියෙල කිරීම දැනට සිදු කෙරෙමින් පවතී. | කුඹුරු ඉඩම් නාමලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| | (ii) 55 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 15 ක පරිපාලන ප්‍රදේශයේ පිහිටි කුඹුරු ඉඩම් මැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | - | කාරක සභා 15 ක් විසින් පරිපාලන ප්‍රදේශයේ පිහිටි කුඹුරු ඉඩම් දැනට Google Map ආධාරයෙන් මැනුම් කටයුතු සිදුකර කුඹුරුවල ප්‍රමාණය ලබා ගෙන ඇත. GEO Goviya වැඩසටහන් යටතේ එක්එක් කුඹුර GPS උපකරණ මැනීමේ කටයුතු සිදුකරනු ලැබේ. | මැනුම් කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| | (iii) 56(i) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින්ම අක්කර බදු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | - | අක්කර බදු ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය මූලික වැඩකොටස් දැනට සිදු කරමින් පවතී. එය නිමකිරීමෙන් පසු විගණනයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | අක්කර බදු ලේඛනය පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 502 (2) | ගොවිජන සේවා කාරක සභා 15 ක් විසින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. තවද, එය භෞතිකව සත්‍යක්ෂණය කර නොතිබුණි. | - | කාරක සභා 13 ක් විසින් ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතින අතර, එය භෞතිකව සත්‍යක්ෂණය කිරීමට කටයුතු කරමින් පවතී. | වත්කම් ලේඛනය පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 880, 881 | ගොවිජන සේවා කාරක සභා 13 ක ඇප මුදල් තැබිය යුතු නිලධාරීන් 39 දෙනෙකු විසින් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | 267,500 | කාරක සභාවල නිලධාරීන් විසින් මෙම වර්ෂයතුල ඇප තැබීමට කටයුතු කර ඇත. | ඇප තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ගොවිජන සංවර්ධන කොමසාරිස් ජෙනරාල්ගේ චක්‍රලේඛ** | | | | |
| | (i) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022.06.01 දිනැති අංක 7/5/12/11 දරණ ලිපිය | ගොවිජන සේවා කාරක සභා 15 ක් විසින් දිස්ත්‍රික්ක භාර සහකාර කොමසාරිස් සහ ගොවිජන සේවා පරිපාලන කමිටු අතර ගනුදෙනුවලින් ලැබිය යුතු සහ ගෙවිය යුතු හිඟ මුදල් 2022.07.28 සහ වෙනත් ආයතන සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන අතර ගනුදෙනු 2022.08.25 දිනට ප්‍රථමද නිරවුල් කළ යුතු බව සඳහන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා නිරවුල් කර නොතිබුණි. | 41,076,892 | හිඟ මුදල් පියවීමට කටයුතු කළ යුතුය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 2022.01.05 දිනැති අංක 7/2/13/පොදු දරණ ලිපිය | ගොවිජන සේවා කාරක සභා 09 ක ගොවිජන සංවර්ධන නිලධාරි විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරි වැඩසටහන් දින දර්ශණ සහ දෛනික සටහන් සංශෝධන ඉදිරිපත් කර නොතිබුණි. | - ඉදිරියේදි කාරක සභාවල දෛනික සටහන් සහ දෛනික සටහන් සංශෝධන පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | ඉදිරි වැඩසටහන් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 15 ක මෙහෙයුම් ප්‍රතිඵලය රු.22,404,331 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,144,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 18,260,331 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාවය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උරුම්පිරායි ගොවිජන සේවා කාරක සභාවේ එකතුව රු. 191,564 ක් පාඩුව පොත්වලින් කපා හැරීම සඳහා වර්ෂ 27 ක කාලයක සිට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | 1995 වර්ෂයේ මධ්‍යස්ථානයට සිදුවූ පාඩුවල එකතු වටිනාකම රු. 191,564 ලෙස දක්වා තිබුණි. මෙය මුදල් රෙගුලාසි අනුව නිසි පරිදි පොත් වලින් කපා හැරීමට කටයුතු කරන බව දන්වන අතර, හානි පාඩු ලේඛනයද පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. | හානි පාඩු ලේඛනය පවත්වා ගෙන යාම සහ පාඩුව පොත්වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | වාවකච්චේරි ගොවිජන සේවා කාරක සභාවේ එකතුව රු. 901,925 ක් වූ වර්ෂ 21 ක සිට වර්ෂ 32 දක්වා පැවති පාඩුව කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව විධිමත් පරිදි කපා හැරීමට කටයුතු කරන අතර, හානි පාඩු ලේඛනයද පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. | පාඩු කපා හැරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යමක්ෂතා

පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 03 ක 2021 වර්ෂයේදි කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු. 707,912 ක් වැය කර කාබනික පොහොර නිෂ්පාදන කර තිබූ නමුදු, 2022.12.31 දින දක්වා අදාල අරමුණ සඳහා යොදවා ගැනීමකින් තොරව කාරක සභා 04 ක ගබඩා කර තිබූ බව නිරීක්ෂණය විය. | කාරක සභා 04 ක් විසින් නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර වල තත්ත්ව පරීක්ෂණය සහ විකුණුම් මිල තීර්ණය කිරීමෙන් පසු බෙදා හැරීමට කටයුතු කරනු ලැබේ. | කාබනික පොහොර අදාල අරමුණ සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 13 කට අයත් රෝද හතරේ ට්‍රැක්ටර් රථ 58 ක් සහ ටේලර් 06 ක් වර්ෂ එක සිට වර්ෂ 12 දක්වා කාල පරිච්ඡේදය තුල අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කාරක සභා විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | කාරක සභා 13 කට අයත් රෝද හතරේ ට්‍රැක්ටර් රථ 58 ක් සහ ටේලර් 06 කින් අළුත්වැඩියා කළ හැකි ට්‍රැක්ටර් රථ සහ ටේලර් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කාරක සභා විසින් කටයුතු කර ඇත. | ට්‍රැක්ටර් රථ සහ ටේලර් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 ක 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබූ රු. 864,154 ක් වටිනා පස් පරීක්ෂා කිරීමේ උපකරණ (Soil Testing Instrument) 04 ක් කාරක සභා 04 කට ලබා දී පරීක්ෂණයට අවශ්‍ය පුහුණුව ලබා දීම සඳහා රු. 32,000 ක් වැය කර තිබුණු අතර, අදාල උපකරණ අද දක්වා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අප වෙත ලැබුණු පස් පරීක්ෂණ උපකරණ යොදවා පස්වල PH, EC පමණක් පරීක්ෂා කළ හැකිවුවද, පස්වල අඩංගු පොහොර ප්‍රමාණය මැනීමට නොහැකි බැවින්ද මෙම උපකරණයට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතාවය හේතුවෙන් අද දක්වා එම උපකරණ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | පස් පරීක්ෂණ උපකරණ අදාල අරමුණ සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 11 ක රජයේ ඉඩම්වල ඉදිකර ඇති රු. | කාරක සභා 11 ක් පවත්වා ගෙන යන ලබන රජයේ ඉඩම්වල | ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 39,705,900 ක් වටිනා ගොඩනැගිලි වල මධ්‍යස්ථාන පවත්වා ගෙන ගිය ද එම ඉඩම්වල අයිතිය පවරා ගැනීමට වර්ෂ 32 ක සිට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇත. | |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට තනතුරු 06 කට අයත් අනුමත සේවක සංඛ්‍යා 370 ක් වූ අතර, තත්‍ය සේවක සංඛ්‍යා 165ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පැවැති පුරප්පාඩු 206 ක් පිරවීමට හෝ අතිරික්තය 11 ක් විධිමත් කිරීමට කාරක සභා 15 ක් විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | කාරක සභා 15 හි අනුමත සේවක සංඛ්‍යා පුරප්පාඩු 206 ක් පිරවීමට සහ අතිරික්ත 11 ක් මාරු කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය පරිදි පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත සේවකයන් වෙන කාර්යාල වලට මාරු කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 14 ක වර්ෂ 2005 – 2022 කාල පරිච්ඡේදය තුල ගොවීන් වෙත ලබා දෙන ලද ණය මුදල් වලින් ගොවීන් 209 දෙනෙකුගේ ණය ශේෂය රු. 11,676,940 ක මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 5. පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 15 ක ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි 133 සහ 134 අනුව අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට ගොවි ජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් ඉකුත් වර්ෂ 10 කට වැඩි කාලයක සිට කටයුතු කර නොතිබුණි. | කාරක සභා 15 ක ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි 133 සහ 134 අනුව ඉදිරියේදී අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |